# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2303/17 - 2022 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2022.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය වරින්වර සංශෝධනය කරන ලදුව, 2022 ඔක්තෝබර් මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2022 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


1A - G 37870 — 17 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 01. ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 25 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 26 සහ 27 අයිතමයන් පිළිවෙලින් අංක 25 සහ 26 වශයෙන් නැවත අංකගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 27 අයිතමය ඉවත් කිරීමෙන්;

(ඈ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමය ඉවත් කිරීමෙන්;

- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)

(2) එම නිවේදනයෙහි "අංක 02. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි පහත සඳහන් අයිතමය ඉවත් කිරීමෙන්;

32. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

(ආ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- ව්‍යාපාර නාම පනත (1987 අංක 7)
- සමාගම් පනත (2007 අංක 7)
- වෙළඳ සළකුණු පනත (1964 අංක 30)
- සීට්ටු ආඥාපනත (1935 අංක 61)
- පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)

(3) එම නිවේදනයෙහි "අංක 14. කෘෂිකර්ම අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 8 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 9 සිට 17 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 8 සිට 16 දක්වා වශයෙන් නැවත අංකගත කිරීමෙන්;

(4) එම නිවේදනයෙහි "අංක 19. කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 7 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 8 සිට 28 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 7 සිට 27 දක්වා වශයෙන් නැවත අංකගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 27 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

28. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
29. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

(ඈ) එහි III වැනි තීරුවෙහි "විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)" අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

- ව්‍යාපාර නාම පනත (1987 අංක 7)
- සමාගම් පනත (2007 අංක 7)

- වෙළඳ සළකුණු පනත (1964 අංක 30)
- සීට්ටු ආඥාපනත (1935 අංක 61)
- පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)

(5) එම නිවේදනයෙහි "අංක 03. තාක්ෂණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(*අ*) එහි I වැනි තීරුවෙහි අංක 10 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

11. වර්ධනය වන තරඟකාරී වෙළඳපොළ තුළ, පොදු යහපත සුරකිමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ කටයුතු නියාමනය කිරීම.
12. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු
13. හරිත තාක්ෂණ ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වලට තාක්ෂණික සහාය ලබාදීම.

(*ආ*) එහි I වැනි තීරුවෙහි අංක 11 සහ 12 අයිතමයන් පිළිවෙලින් අංක 14 සහ 15 වශයෙන් නැවත අංකගත කිරීමෙන්;

(*ඇ*) එහි II වැනි තීරුවෙහි අංක 4 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ අනුබද්ධිත ආයතන
6. රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය

(*ඈ*) එහි III වැනි තීරුවෙහි "ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6)" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන්;

- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත(1991 අංක 25)
- පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (2022 අංක 9)

EOG 10 - 0237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.